# කුට්ටම් පොකුණ



ලක්ෂ්මන් කොඩිතුවක්කු

# හොඳ ළමයා



සෑම දරුවෙකුම මෙලොවට බිහිවන්නේ හොඳ ළමයෙකු ලෙසය. ඔවුන් මල් මෙන් සුවඳය. විකසිතය. ක්‍රෝධය, වෛරය, පළිගැනීම, තෘෂ්ණාව එම සිත් තුළ නැත. එහෙත් ඔවුන් කෙමෙන් කෙමෙන් වැඩිවියට පත්වීමේදී මේ සියළු දේවල් ඔවුන් තුළින් දෘෂ්‍යමාන වන්නේ, හොඳ දරුවෙකු ලෙස ඔවුන් මෙලොවට කෙසේ බිහිවුයේ දැයි යන්න තවකෙනෙකුට තේරුම් ගැනීමට නොහැකිවන පරිද්දිනි. අද ලොවේ මෙන්ම පියලු ජන සමාජයන් තුල හොඳ දරුවන් කොතෙක් සිටියත් හොඳ මිනිසුන් සොයාගැනීමට නොහැකි වන අයුරින් එම සමාජය පිරිහෙමින් පවතී. මවගේ රුහිරු කිරි බවට පත්වී එම කිරි උරා බොන දරුවන් පසුකලකදී ලේ පිපාසිතයෙන් වී ගහමරා ගනී. කළ කෝළාහාල කරගනී. එක මව්කුසින් උපන් සහෝදර සහෝදරියන් මහ පොළව බෙදාගැනීමට නඩුහබයකි, මිනිමරා ගනී. දේශසීමා බෙදා ගැනීමට රටවල් යුද්ධ කරති. තෙල් බෙදා ගැනීමට, එම සම්පත් තමන්ට නිසිසේ පරිහරණය කරගැනීමට තවත් රටක ලේ සොලවති. අද ලොවේ හැටි එහෙමය.

ආගමට මුවා වී චීවරය පොරවාගත් චීවරධාරින් අහිංසක ජනයා රවටමින්, එම ජනයාගේ ප්‍රශ්නවලට විසඳුම් තමා ළඟ ඇති බව පවසමින් මුදල් ගසා කන අයුරු අප දිවයින තුළ ජීවත්වන බුද්ධිමත් ජනයාට අරුමයක් නොවේ. පසුව එම වංචාව හෙළිවු විට ඔහු එම චීවරය අතහැර වෙනත් නමකින් එම වංචාවට අතපොවා ඇත. එසේම ජනයාට ආදර්ශයක් විය යුතු සංඝනායක හිමිනමක් කුඩා දැරියක කෙළසා වෙනත් රටකට පළා ගොස් මෑතකදී කොටු වු අයුරු අපට මාධ්‍ය තුළින් දැකගත හැකිවිය. ක්‍රිස්තියානි ආගමට මුවාවෙන් ළමා නිවාස පිහිටුවා ගෙන ළමා අපචාරවලට දරුවන් යොදවන පුජකවරුන්ද, එම ළමුන් ඔවුන් අතින් ද අපයෝජනයට ලක්වන අයුරු හෙළිවුයේ මැතකදීය. අද අපේ රටේ නීතිය වල් වැදෙමින් පවතී. නීතිය අතටගත් දේශපාලකයන් නීතිය තමුන්ගේ වාසියට මෙන්ම විරුද්ධ පාක්ෂිකයන්ගේ අවාසියට හරවන්නේ අවිගත් කණ්ඩායම්වලට බලය ලබාදීමෙනි. අප රටේ මර්වින් සිල්වා ඇමතිවරයා ජනාධිපති බලතල ඉක්මවා යන තරමට බලය හා අවිය හිමි ඇමතිවරයෙකි. උසාවි තීන්දුවකින්වත් තහනම් කර පොලිස් නියෝගවලට නතර කරගැනීමට නොහැකි

වූ හලාවත මුන්නේශ්වරම් කෝවිලේ බිලි පුජාව නතර කරගැනීමට නොහැකිවු හලාවත මුන්නේශ්වරම් කොවිලේ බිලි පුජාව ඔහුට නතර කර ගැනීමට හැකිවුයේ ඒ නිසාය. අවියක් නොසොල්වාම තම කටින් පූසාරියා බය කිරීමට තරම් හැකියාවක් ඇති ඇමතිවරයා තම නොහොඳ ක්‍රියා සියල්ල අකාමකා දමන්නේ සතුන් ඝාතනය නතර කිරීමට අණදීමෙනි. සතුන් මරා මස් කන මිනිසුන්ගේ අත් කට කපා දැමිය යුතු බව ඔහු කැළණි ජනතාව අමතා ප්‍රකාශ කළේය. එහෙත් මිනී මරා මත්ද්‍රව්‍යය අලෙවිකරන පාතාලයේ ගිනි අවි ජාවාරම් කරන අපරාධකරුවන්ට කුමක් කළ යුතුද යන්න ඔහු තවම ප්‍රකාශ කර නැත.

ඔහු අපරටේ මහජන සම්බන්ධතා පිළිබඳ ඇමතිවරයාය. කැළණිය ආසනය ඇතුළු අපරටේ සෑම ප්‍රදේශයකටම නීතිගත තැබෑරුම් ඇත. හොර මත්පැන් තිත්පොළවල් ඇත. කුඩු ජාවාරම්කරුවන්ගෙන් පිරී ඉතිරී පවතී. ගව ඝාතනාගාර ඇත. ගස් කැපීමක් සතෙක් මරණ තරමටම සාපරාධී ක්‍රියාවකි. ජාතියට සෙවණ දෙන වනයේ ගස් කපන හොර දැව ජාවාරම්කරුවන් රිසි සේ තම කාර්යය කරගෙන යති. දේශපාලකයන් මහජන මුදල් පිල්ලි ගසිමින් වංචාව දුෂණය ජනතාව අනුමත කරන තත්ත්වයකට පත්කොට ඇත. බාර ඔප්පු කිරීමට සත්වයන් දංදෙන ජනයා සිටින රටකට, සතුන් නොමරා කඩෙන් මස් රාත්තලක් ගෙනත් ආහාරයට ගන්නා මිනිසුන්ට මර්වින් සිල්වා වීරයෙක් වන්නේ එසේය. දෙමටගොඩ මස් මඩුවේ තිරිසන් ලෙස මරණ ගවයන් බේරාදෙන ලෙස ඔවුන් මර්වින් සිල්වා ඇමතිවරයාගෙන් ඉල්ලා නොසිටින්නේ කාලි අම්මාගේ පිහිට පතන මිනිසුන් නිසා විය හැකිය.

අපේ ආගමට අනුව පස් පව් කිරීම පාපයකි. සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, බොරුකීම, සුරාව මේ සියල්ල පිළිබඳව හිමිදිරියේම ජනතාවට ශ්‍රවණය කිරීමට දී දවස පටන්ගන්නා රටේ මේ සියළු දේවල් රාත්‍රිය වනවිට වීදි බසියි. එදා මත්පැන් දුම්වැටි සමාජගතවන විට දෙමව්පියන් බියවන්නට ඇත. ඊතයිල් සාරය බීමට පෙර අපේ ජනයා රා බීමට පුරුදුව සිටියහ. සිගරට් එන්නට පෙර දුම්කොළ සැපීමට , ඉරීමට පුරුදුව සිටියහ. පෘතුගීසි , ලන්දේසි ඇතුළු ඉංග්‍රීසින්ද අපේ රටේ පාලනය සියතට ගත් පසු වයින්, අරක්කු සියල්ල ඔවුන් අපට පුරුදු කළහ. -අනේ පුතේ ඕව කටේ ගහල පාප කර්ම කරගන්න එපා" යැයි අපේ වැඩිහිටියෝ පැවසුවේ ඒ බියත් එදා පැවති ආගමේ දහමේ නැඹුරුවත් නිසාය. අද සිගරට් පැකැට්ටුවේ නරක් වු පෙනහැල්ලක් මුද්‍රණය කර පෙන්නා දීමට තරම් දුරදිග ගියේ මේ පාපකර්ම අපේ ජනයා හොඳින් වැළඳගත් නිසාය. අද රිය අනතුරු බොහොමයක් සිදුවන්නේ මත්පැන් බී රියපදවන මිනිසුන් අතිනි. අද මුළු ලෝකයේම සෞඛ්‍යය ක්ෂේත්‍රයට විශාල ප්‍රශ්නයක් වී ඇත්තේ, දුම්වැටි මත්පැන් හා මත්ද්‍රව්‍යයන්ය. රටේ සම්පත් මෙන්ම බිලියන ගණන් මුදල් මේ වෙනුවෙන් වැය කරන්නාට සිදුවී ඇත. එනිසා හොඳ මිනිසුන්ගේ ශ්‍රමයටද ඒ මිනිසුන්ගේ ධනයටද මේ පාපකර්මයට යෙදවීම ලෝකයට අඳුරක් ගෙනදෙන කාරණයක් නොවේද? අප ජීවත්වන මෙරටටද එය විශාල ප්‍රශ්නයක් වන්නේ බදු මුදල් ගෙවන ජනයාට ඒබර තවත තවත් කරගහන්නට වීම නිසාය.

අද ලොවේ වැඩිම පස් පව් කරන පුද්ගලයන් වන්නේ දේශපාලකයන්ය. කාමයෙහි වරදවා හැසිරීම ඔවුන් අතින් බොහෝ දුරට සිදුවේ. බොරුකීම, සොරකම් කිරීම සිදුවන්නේ මහා පරිමාණයෙන්ය. රටක ජනතාව රවටා බලය ලබාගැන්මට කියන බොරුවත්, අහිංසක මිනිසකු වධහිංසාවලින් බේරීමට පොලිසියට කියන බොරුවකුත් අතර වෙනස පිළිබඳව ලොකු පරතරයක් ඇත. බොරුව බොරුවනම් මේ දෙදෙනාම එකම ගනයට වැටේද? මේවා වැඩිදුර විග්‍රහ කළ යුතු කාරණාය. එසේම යුද්ධයකදී තම රට වෙනුවෙන් සතුර හමුදව විනාශ කිරීමට අණදීමට රටක නායකයකුට සිදුවේ. මිනිස් ඝාතනය පාපයක් වුවත් රටේ ජීවත්වන අනෙක් ජනයාගේ සුභසිද්ධිය වෙනුවෙන් එවැනි අණක් ලබාදීම උතුම්ද, නැත්නම් පාපයක්ද කියා දැනගැනීමට සියල්ලන්ටම අයිතියක් ඇත. ඒ පිළිබඳව විග්‍රහ කිරීමට මෙම ලිපියෙන් බලාපොරොත්තුවක් නැත. කුසගින්නට පාන් කැබැල්ලක් සොරකම් කරන දරුවාත්, තම දරුවන්ට පස්ගෝ රස ලබාදීමට රටේ ධනය සොරකම් කරන පුද්ගලයත් දෙදෙනාම සොරුන්ද යන්න අද දෙවරක් සිතිය යුතුය. උපන්දා සිට මැරෙනතුරු කිරි බොන්නේ මිනිසුන්ය. සතුන් එසේ නැත. මව්කිරි බී පසුව එළකිරි බොන මිනිසුන් අතින් කෙරෙන වැරදි සමුදයන්ට ඔවුන් -හරක්" කියා අපිට බේරිය නොහැක. ඒ මිනිසුන් අහිංසක හරකාටත් වඩා තිරිසන් නින්දිත වැඩ කරන නිසාය.

මා මේ ඉහත සියළු කරුණු කාරණා ගෙනහැර පෑවේ, අපේ රටට ඔබින, එසේම ලොවටම ගැලපෙන, ආදර්ශමත් ඔවදන් රැසක් පිරි -හොඳ ළමයා" සංයුක්ත තැටිය වෙනුවෙනුත් එවැනි උතුම් ක්‍රියාවක් ලොවක්, වටිනා නිසාත්ය. සිඩ්නි නුවර, කටුම්බා ආරාණ්‍යාධිපති පුජ්‍ය කුඩාගල කෝවිද හිමියන් රචිත හොඳ ළමයා කාව්‍යය ග්‍රන්ථය ඇසුරෙන් සකස් කළ කවි ගී සංයුක්ත තැටිය අපේ දරුවන්ට සේම වැඩිහිටියන්ටද ගැලපෙන උතුම් වටිනා ඔවදන් රැසක් පිරි ගී සමුච්චියක් බව මාගේ පිළිගැනීමයි. සිඩ්නි නුවර වෙසෙන කුඩා දරුවන් පිරිසක් ගී ගැයු විශාරද තුෂාරි එදිරිසිංහ විසින් සංගීතවත් කළ මෙම සංයුක්ත තැටිය බෙදා දෙන්නේ නොමිලයේය. වටිනා ඔවදන් පිළිගන්නට මැලි වී ඇති යුගයක වටිනා දෙයක් නොමිලයේ ලබාදීමට එහිමියන් ගත් තීරණය කොතරම් උතුම්ද? කුඩා දරුවන්ගේ මුවින් පිටවන වදන් පිරිසිදුය. එනිසා මේ ඔවදන් වල පාපය තැවරී නැත.

සුදු ඇඳගෙන මම පන්සල් යන්නම්
ලෝකෙට වැඩ ඇති ළමයකු වන්නම්

යන වදන් පෙළෙන් ගී පෙළ ආරම්භ කර ඇති උන්වහන්සේ

කවදහරි මම ලොව ජයගන්නම්
ලෝකෙට වැඩඇති මිනිසකු වන්නම්
යන වදන් පෙළෙන් ගී පෙළ අවසන් කර ඇත.

සදචාරාත්මක දරුවෙකු තුළින් විනයගරුක මිනිසකු බිහිවේ. හොඳ නරක කුමක්ද යන්න කදිමට වටහා දී සරල සුගම වචන යොදා දරුවන්ට පහසුවෙන් අවබෝධ කර ගත හැකි ලෙස නිර්මාණය කර ඇති මෙම ගී තැටිය තුළින් මානව හිතවාදී සමාජ මෙහෙවරක් ඉටුවේ. කුඩා කල ආදරය කරුණාව අහිමි වු නිසි මඟ නොපෙන්වු, ආගමික නැඹුරුවෙන් ඈත්වු, දෙමව්පියන්ගේ කළ කෝළාහල සම්මත මැද ජීවත්වු බොහෝ දරුවන් පසු කලකදී අපරාධකරුවන් වී, සමාජයෙන් කොන්වන වැඩිහිටියන් බවට පත්වන බව සමාජ විද්‍යාඥයන්ගේ මතයයි. එවැනි දරුවන්ට අමාදරහක් වූ මෙම කවි පිංච හා කවි ගී සංයුක්ත තැටිය ළමා මනසට ගෝචරවුවකි. යහපත් පුරවැසියකු බිහිකිරීමට තැනු උපදේශාත්මක කවි ගී පොකුරකි.

සුදු ඇඳගෙන මල් වට්ටිය දෙහොත් මුදුනේ තබාගෙන පන්සල් යන එසේ ගොස් බුදුන් වැඳ සමාජයට වින කරන වැඩිහිටියන්ට තමන්ගේ මුලට ගොස් අතීතය මතක් කර ගනිමින් නැවත හොඳ මිනිසකු ලෙස ජීවත් වීමට වුවද මෙම ගී වැල් කදිම පිටිවහලක් සපයයි.

"කෙනෙකුට විපතක් මම නොකරන්නෙම්
ලෝකෙට වැඩ ඇති ළමයකු වන්නම්"

කිසිවෙකුහට මම පහර නොදෙන්නෙම්
ලෝකෙට වැඩ ඇති ළමයකු වන්නම්"
අන් ආගම් මම ගරු කරලන්නම්
ලෝකෙට වැඩ ඇති ළමයකු වන්නම්"

"අයුක්තියට මම නැගී සිටින්නම්
ලෝකෙට වැඩ ඇති ළමයකු වන්නම්"
"යුක්තිය අබියස දෙකට නැමෙන්නෙම්
ලෝකෙට වැඩ ඇති ළමයකු වන්නම්"

අයුක්තිය අසාධාරණය වෙනුවෙන් කෑමොර ගසන විට ඔවුන් විනාශ කරන්නට මාන බලන සමාජයක, යුක්තියට ඇති ගරුත්වයට හිස නොනමා අසාධාරණය රජ කරන්නන්ගේ හදවතට වදින ගැලපෙන වදන් වලින් පිරි මෙම ගී මල්දම අපේ සමාජයට කොතරම් උචිත නිර්මාණයක්ද? එයට සවන් දෙන ඔබට හොඳින් තේරුම් ගත හැකිවන සරල කවි වලින් පිරි මෙහි වටිනාම ඔවදන ලෙස මම දකින්නේ

ජාතික සමගිය අගේ කරන්නම්
ලෝකෙට වැඩ ඇති ළමයකු වන්නම්
යන දෙපදයි. මෙය ඔබත් අපත් සැමත් සැම කුඩා දරුවෙකුත් සවන් දිය යුතු අගනා ගී වැල් පොකුරක් බව මාගේ පිළිගැනීමයි.

